# කාති අධිකරණ 58 ක් අලුතින්

(ජයන්ත සමරකෝන් සහ තිලිණි ද සිල්වා)

මුස්ලිම් ජනතාව සඳහා කාති අධිකරණ 58 ක් අලුතින් පිහිටුවීමට අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය පියවර ගෙන ඇත.

එම ජනතාවගේ පවුල් ආරවුල් විසඳීම සඳහා කාතිවරුන් යනුවෙන් හඳුන්වන විනිශ්චයකාරුවන්ගේ මූලිකත්වයෙන් යුත් විශේෂ අධිකරණ පිහිටුවා තිබේ.

බේරුවල, අක්කරෙයිපත්තු, මඩකලපුව, අම්පාර, පොතුවිල්, සමන්තුරෙයි ඇතුළු පෙදෙස් කීපයක කාති අධිකරණ 8 ක් මෙම වසරේ පිහිටුවනු ලබයි.

මෙම කාති අධිකරණ මෙතෙක් පවත්වාගෙන ගොස් ඇත්තේ ඒ ඒ විනිශ්චයකාරවරුන්ගේ නිවාසවල බව අමාත්‍යාංශය පවසයි.

නීතිමය කටයුතු ඉටුකර ගැනීමේදී මුස්ලිම් ජනතාවට විඳින්නට සිදුවී ඇති පීඩාවන් සැලකිල්ලට ගෙන අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා විසින් මෙම අධිකරණ පිහිටුවීමට උපදෙස් දී ඇත.

පුද්ගලික නිවාසවල අධිකරණ කටයුතු සිදුකිරීම නිසා එහි ස්වාධීනත්වයට හා අපක්ෂපාතිත්වයට බාධා සිදුවීම වැළැක්වීම අමාත්‍යවරයාගේ අරමුණ වී තිබේ.

මෙම කාති අධිකරණ පිහිටුවීම සඳහා රුපියල් කෝටි 4 කට ආසන්න මුදලක් වෙන්කර ඇත.